සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education Southern Province தென் மாகாணக் கல்வித் திணைக்களம்

| 29 | S | I |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்**
**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**13 ශ්‍රේණිය**
**Grade 13**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I**
**Communication & Media Studies - I**

**පැය දෙකයි**
**Two hours**

**විභාග අංකය : ..............................**

**සැලකිය යුතුයි :**
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන ඒ උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

(01) සන්නිවේදනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. සන්නිවේදන ක්‍රියාවලියේ දී සන්නිවේදක හා ග්‍රාහක භූමිකා ස්ථාවරව පවතී.
2. ග්‍රාහකයෙකු නොමැති වුවද සන්නිවේදනය සිදුවේ.
3. මානව සන්නිවේදනය කාර්මීකරණයත් සමග ගොඩනැගුණි.
4. සන්නිවේදනය ඒක මාර්ගිකවම සිදු කෙරේ.
5. සන්නිවේදනය සංකේත හුවමාරු ක්‍රියාවලියකි.

(02) පුද්ගලයන් දෙදෙනෙකු අතර සමාන මානසික තත්ත්වයක් ඇති වීමට තොරතුරු ගැබ් වූ සංඥා බලපාන බව ඉදිරිපත් කළේ,
1. ෂැනොන් වීවර්  2. එඩ්වඩ් සැපීර්  3. චාල්ස් කූලී
4. විල්බර් ශ්‍රාම්  5. හැරල්ඩ් ලැස්වෙල්

(03) අන්තර්ජාලය හා ජංගම දුරකථන මාධ්‍ය සම්බන්ධයෙන් දිය හැකි වඩාත් සාධනීය ප්‍රකාශය තෝරන්න.
1. සමාජ ජීවිතයට අත්‍යවශ්‍ය වේ.
2. මේවා සමාජ සහජීවනයට බාධා පමුණුවයි.
3. තොරතුරුවලට බාධා ඇති වීම අවම මාධ්‍ය යුගලයයි.
4. අන්තර්ජාල තාක්ෂණයට ජංගම දුරකථනය සම්බන්ධ නොවේ.
5. තොරතුරුවලට වාරණයෙන් බාධා පැමිණිය හැකිය.

(04) A. අම්බලමක රැස්වන මගීන් කණ්ඩායමක්
B. බස් නැවතුමක සිටින පුද්ගල කණ්ඩායමක්
C. කලා උළෙල සඳහා සම්බන්ධ පිරිස
D. විහාරස්ථානයක කඨින පිංකම සංවිධානය කරන ආගමික කණ්ඩායමක්

ඉහත ප්‍රකාශ අතරින් කණ්ඩායම් සන්නිවේදනයක් සිදු විය හැකි වන්නේ,
1. A B පමණි  2. C, D පමණි  3. A C පමණි
4. A B C D සියල්ල  5. C D අසත්‍ය නමුත් AB සත්‍ය වේ.

(05) කිසියම් ආයතනයක සිදුවන අති විශාල මුදලක් වංචා කිරීමේ සිදුවීමක් පිළිබඳ තොරතුරු පසිඳු අනිල්ට කීවේය. අනිල් එය අධ්‍යක්‍ෂ මණ්ඩලයේ දී හෙළි දරවු කරන ලදී. ඒ ගැන කල්පනා කළ අධ්‍යක්‍ෂවරයා එය ජනමාධ්‍යය මඟින් ප්‍රසිද්ධ කළේ ය. මෙහි දී දක්නට ලැබුණු සන්නිවේදන ප්‍රභේද වූයේ,

1. අන්තර්පුද්ගල, සමූහ අන්තර්වර්ති හා ජන සන්නිවේදනයයි.
2. විධිමත් සමූහ, පුද්ගලාන්තර හා සමූහ සන්නිවේදනයයි.
3. අන්තර්වර්ති, අන්තර්පුද්ගල, සමූහ හා ජන සන්නිවේදනයයි.
4. වාචික, ලිඛිත, සමූහ හා ජන සන්නිවේදනයයි.
5. පුද්ගලාන්තර, අන්තර්වර්ති, සමූහ හා ජනසන්නිවේදනයයි.

(06) සංජානනයන් අර්ථ කථනය කිරීම සන්නිවේදනයේ ප්‍රමුඛ කාර්යයකි. ඒ සඳහා මූලික වශයෙන් අත්‍යවශය වන සන්නිවේදනය වන්නේ,

1. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය යි.
2. නිර්වාචික සන්නිවේදනය යි.
3. සමූහ සන්නිවේදනය යි.
4. සනාහුභූතිය යි.
5. පුද්ගලාන්තර සන්නිවේදනය යි.

(07) බස් රථයක ගමන් කළ සමන් හා කමල් හිඟන්නෙකුගේ ආයාචනයක් නිසා දුඩි කරුණාවෙන් තමන් අත තිබූ බත් පාර්සලය ද මුදල් ද ඔහුට පරිත්‍යාග කළහ. මෙය සන්නිවේදනයට අදාළව,

1. අනුග්‍රාහයයි.
2. සහානුභූතියයි.
3. පරිත්‍යාගයයි.
4. අනුකම්පාවයි.
5. බලපෑමයි.

(08) අන් අය සමඟ අන්තර් ක්‍රියාවේ යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස තබා පිළිබඳව සංජානනයක් ඇති කර ගැනීම හඳුන්වන්නේ,

1. සංජානනය ලෙසිනි
2. ඉගෙනීම ලෙසිනි
3. ස්ව සංකල්පය ලෙසිනි
4. ආත්ම භාෂාණය ලෙසිනි
5. ආත්ම විශ්වාසය ලෙසිනි.

(09) **සමාජානුයෝජනය** වර්තමානයේ දී ප්‍රබලව සිදු වන්නේ ජන මාධ්‍ය මඟිනි. එහි දී පුද්ගල ජීවිතයට වැදගත්වන කරුණ වන්නේ,

1. ජනප්‍රිය සංස්කෘතියේ සාමාජිකයකු බවට පත් කරයි.
2. අන්තර් සංස්කෘතික සබඳතා ගොඩ නංවයි.
3. අධි පරිභෝජන සංස්කෘතියේ සාමාජිකයකු බවට පත් කරයි.
4. සමාජයේ සාමාජිකයන්ට සිය භූමිකාව කවරේ ද යන්න පැහැදිලි කරයි.
5. සියලු සමාජ ක්‍රියාකාරකම් මාධ්‍ය මූලිකව සිදුවන ආකාරය පැහැදිලි කරයි.

(10) රූපවාහිනිය නරඹමින් සිටි දරුවන් කණ්ඩායමක් පැරණි සමාජයේ සිදු වූ විවාහ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ටෙලිනාට්‍යයෙන් අවබෝධ කරගත නොහැකි වී කාටූන් චිත්‍රපටයක් බැලීය. මෙය සන්නිවේදන අධ්‍යයනට අදාලව විග්‍රහ වන්නේ,

1. පැරණි සම්ප්‍රදායික සංස්කෘතිය ප්‍රතික්ෂේප කිරීමක් වශයෙනි.
2. රූපවාහිනි වැඩ සටහන ජනප්‍රිය සංස්කෘතියේ නොවූ බැවිනි.
3. පැරණි විවාහ චාරිත්‍ර වාරිත්‍ර ප්‍රතික්ෂේප කිරීමක් වශයෙනි.
4. සහානුභූතිය පිළිබඳව ගැටලුවක් වශයෙනි.
5. අත්දැකීම් පසුතලය සම්බන්ධ ගැටලුවක් වශයෙනි.

(11) පුවත්පත් සංස්කාරකවරයකුට ලැබී තිබූ ලිපියක වාක්‍ය අතරින් නිවැරදි කළ යුතු වාක්‍ය වූයේ කුමක් ද?

1. ඔහු තමාගේ ජාතික අභිමානය පිළිබඳව ආඩම්බරයෙන් කථා කළේ ය.
2. මාගේ සංස්කෘතික විශ්වාස ඔවුහු අවමානයට භාජනය කළහ.
3. ව්‍යවස්ථාව පිළිබඳ සියල්ලන්ගේ විරෝධය තනි අරමුණක් වෙනුවෙනි.
4. බටහිර අධිරාජ්‍යවාදීන් තමන්ගේ වෙස් මුහුණු හෙළි කරති.
5. දේශපාලකයන් බොරු කියතියි ජනතාව සිතති.

- **12 සිට 16 දක්වා ප්‍රශ්නවලට වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| මූලාශ්‍රය | A | සංදේශය | B | සම්ප්‍රේක්ෂණය | C |
| සන්නිවේදක | D | ආයෝජනකරු | E | මාධ්‍ය | F |
| ග්‍රාහකයා | G | විකේතකරු | H | බාධා | I |
| ප්‍රතිප්‍රේශණය | J | අග්‍රස්ථය | K | බලපෑම | L |

(12) A C H K අංග අන්තර්ගත ආකෘතිය වන්නේ,

1. විල්බර් ශ්‍රාම් 2. හැරල්ඩ් ලැස්වෙල් 3. ෂැනොන් වීවර්
4. ඩේවිඩ් කේ බර්ලෝ 5. ශ්‍රාම් ඔස්ගුඩ්

(13) සන්නිවේදනය එක් ස්ථානයකින් ආරම්භ වී අනෙක් අන්තයෙන් කෙළවර නොවී චක්‍රීය වන්නේ කුමන අංග සම්බන්ධ වූ විට ද?

1. A B F H 2. D B G J 3. A C G J
4. B D F G 5. D B G L

(14) හැරල්ඩ් ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියේ අන්තර්ගත ලක්ෂණවල නිවැරදි අනුපිළිවෙල දක්වෙන්නේ,

1. D B F G L 2. A B F I 3. D B F K
4. A B F G J 5. B D F H L

(15) ෂැනොන් වීවර් ප්‍රමුඛ ලෙස අවධාරණය කරන ලද අංග දෙකක් වන්නේ,

1. A I 2. B D 3. D H
4. I K 5. C I

(16) බර්ලෝගේ සන්නිවේදන ආකෘතියේ අන්තර්ගත ලක්ෂණ ඇතුළත් නොවන අංග ද ඇතුළත් වරණය තෝරන්න.

1. C J K L 2. A B F G 3. D B F G
4. A B G F 5. B D F G

(17) ජනමාධ්‍ය මඟින් බරපතල රිය අනතුරු හා අපරාධ මුල් පිටුවේ ප්‍රමුඛ ලෙස පළ කෙරේ. මෙම පුවත් විග්‍රහ වන්නේ,

1. කාලීන පුවතක් වශයෙනි 2. දෘඪ පුවත් වශයෙනි
3. ගවේෂණාත්මක පුවත් වශයෙනි. 4. බීට්ටු වාර්තා වශයෙනි
5. මෘදු පුවත් වශයෙනි.

(18) ගෝලීයකරණය නිසා සමාජය තුළ නිර්මාණය වූ ආර්ථික හා දේශපාලන ක්‍රියාවලිය හඳුන්වන්නේ,

1. ජනප්‍රිය සංස්කෘතිය ලෙසිනි
2. මාධ්‍ය සංස්කෘතිය ලෙසිනි
3. ලිබරල් වාදය ලෙසිනි
4. මැක්ඩොනල්ඩ්කරණය ලෙසිනි
5. ජාතික ආර්ථිකය ලෙසිනි

(19) ගෝලීය සංස්කෘතියේ දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ කුමක් ද?

1. සමාජ ක්‍රියාකාකරම් මාධ්‍ය මූලිකව සිදු කිරීමයි.
2. ජනමාධ්‍යයේ විවිධ සංඝටක නිර්මාණය වීමයි.
3. සමාජය තුළ ඒකාකෘතිකරණයක් නිර්මාණය වීමයි.
4. මානව ජීවිතය සන්නිවේදන ක්‍රියාවලියට අනුගත වීමයි.
5. ජනප්‍රිය සංස්කෘතිය සමාජගත වීමයි.

(20) ජනමාධ්‍යවල ග්‍රාහක කණ්ඩායම තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,

1. ස්ථාවර වීමයි.
2. සක්‍රීය වීමයි.
3. දුර්වල වීමයි
4. විශාල කණ්ඩායමක් වීමයි.
5. කල්පිත කණ්ඩායමක් වීමයි.

(21) මානව භාෂාවේ දුරස්ථාපනය හා නිර්මාණාත්මක භාවය යනු,

1. විස්තරාත්මක තොරතුරක් නවමු ආකාරයෙන් ඉදිරිපත් කිරීමයි.
2. නව තොරතුරු ලෝකයේ ඕනෑම ස්ථානයක ඉදිරිපත් කිරීමයි.
3. ඕනෑම ස්ථානයක ඇති සිදු වීමක් විස්තරාත්මකව ඉදිරිපත් කිරීමයි.
4. ලෝකයේ ඕනෑම සිදුවීමක් පරිකල්පනීය ලෙස ඉදිරිපත් කිරීමයි.
5. නිර්මාණාත්මක තොරතුරක් විස්තරාත්මකව ඉදිරිපත් කිරීමයි.

(22) ශ්‍රවණය පුද්ගලාන්තර සන්නිවේදනය හා සම්බන්ධ නිපුණතාවයකි. එය සූත්‍ර ගත කළ විට අනුපිළිවෙළ වන්නේ,

1. හැඟීම්, සිතුවිලි, තේරුම් ගැනීම හා චර්යාවයි.
2. ඇසීම, ඇගයීම, සිතුවිලි බවට පත් කිරීම, ප්‍රතික්‍රියා දැක්වීමයි.
3. ඇසීම, තේරුම් ගැනීම, ඇගයීම හා ප්‍රතික්‍රියා දැක්වීමයි.
4. ඇසීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම හා ඇගයීමයි.
5. ඇසීම, ප්‍රතික්‍රියා දැක්වීම, තේරුම් ගැනීම හා ඇගයීමයි.

(23) සමාජානුයෝජන ක්‍රියාවලිය හා සම්බන්ධ සංකල්ප කීපයක් ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | සංජානය | B | අනුකරණය | C | විසදෘශභාවය |
| D | භූමිකා නිරූපණය | E | තදාත්මීකරණය | F | සංඝටනය |

ඉහත අංක අතරෙන් වඩාත් නිවැරදි වන්නේ,

1. A B D ය.
2. B D E ය.
3. A E F ය.
4. A B E ය.
5. B C D ය.

(24) නිර්වාචික සන්නිවේදනය ප්‍රබලව දැකිය හැකි සන්නිවේදන ප්‍රභේදය වන්නේ,

1. පුද්ගලාන්තර සන්නිවේදනයේ දී ය.
2. වාචික සන්නිවේදනයේ දී ය.
3. සමූහ සන්නිවේදනයේ දී ය.
4. ජන සන්නිවේදනයේදී ය.
5. ශ්‍රව්‍ය සන්නිවේදනයේ දී ය.

(25) භාෂාවේ **අර්ථවේදය** හා **සංඥාර්ථවේදය** හඳුනා ගැනීම දැකිය හැකි වන්නේ,

1. භාෂාවේ රූපණය තුළයි.
2. භාෂාවේ භාෂණය තුළය
3. නව මාධ්‍ය භාෂා තුළයි
4. භාෂාවේ විවරණය තුළයි.
5. භාෂා උපාර්ජනය තුළයි.

(26) සමූහ සන්නිවේදනයේ දී **විසම්මුතියේ** අගය ප්‍රකාශ කළ හැකි වඩාත් ප්‍රශස්ත ප්‍රකාශ කළ හැකි වන්නේ,

1. අධිපතිවාදී සංකල්පය මත විරුද්ධ මත දැරීම.
2. සමූහ සන්නිවේදනයේ දී වගකීම් හා වගවීම් පැහැදිලි වීම.
3. සම්මුඛ සාකච්ඡා මඟින් ගැටලුවලට විසඳුම් ඉදිරිපත් වීම.
4. අනෙකාගේ මතයට විරුද්ධ වුවත් එම මතය දැරීමට අයිතියක් තිබීම.
5. විරුද්ධ මත දැරීමට අයිතිය පැවතුණ ද එකඟ නොවීම.

(27) මුද්‍රණ ශිල්පය ආරම්භ වූ රටක් ලෙස සැළකිය **නොහැකි** වන්නේ,

1. චීනය
2. ජර්මනිය
3. නෝර්වේ
4. බ්‍රිතාන්‍ය
5. ප්‍රංශය

(28) සන්නිවේදනයේ දී පුද්ගලයා හා බැඳුණු ලක්ෂණ කීපයක් පවතී.

A - ඉගෙනුම  B - අපේක්ෂා  C - ලැදියා
D - හැකියා  E - ශාරීරික ස්වභාවය

ඉහත ලක්ෂණ අතරින් සංජානනය හා සම්බන්ධ වන්නේ,

1. ඉහත කිසිවක් නොවේ.
2. ඉහත සියල්ලම
3. A B C පමණි
4. B C D පමණි
5. C D E පමණි.

(29) පහත දැක්වෙන්නේ සන්නිවේදනයේ දැකිය හැකි විශේෂතා කීපයක් වේ.

A - සන්නිවේදනය ක්ෂණිකව සිදුවීම.
B - තොරතුරු අපෞද්ගිලක වීම.
C - නිර්වාචික සන්නිවේදනය ප්‍රබලව යොදා ගැනීම
D - ග්‍රාහකයාගේ සමස්ත පෞරුෂ ප්‍රදර්ශනය වීම.
E - ප්‍රතිපෝෂණය තරමක් ප්‍රමාද වීම.

ඉහත ලක්ෂණ අතරින් පුද්ගලාන්තර සන්නිවේදනය හා සම්බන්ධ වන්නේ,

1. A C D පමණි.
2. A B C පමණි.
3. A B D පමණි.
4. A B E පමණි.
5. B D E පමණි.

(30) භාෂා ප්‍රභේද කීපයක් පහත ඉදිරිපත් කර ඇත.

A - එකම කාරණය විවිධ දෘෂ්ටි කෝණයෙන් ඉදිරිපත් වීම.

B - නියමිත සම්ප්‍රදායන් යෙදුම් හා විරාම පැවතීම.

C - රිද්මය, වේගය, යෙදුම්, ආදියෙහි අවස්ථානුකූල විශේෂතා පැවසීම

D - භාෂාවේ අර්ථයන් තහවුරු වීම / වෙනස් වීම

ඉහත ප්‍රභේද අනුපිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ,

1. භාෂණය, රූපණය, විවරණය, කථනය
2. විවරණය, ලේඛනය, කථනය, රූපණය
3. රූපණය, භාෂණය, විවරණය, කථනය
4. ලේඛනය, රූපණය, කථනය, විවරණය
5. භාෂාණය, ලේඛනය, විවරණය, කථනය

(31) මාධ්‍ය වෙළඳ දැන්වීම් සමාජයට විවිධ බලපෑම් ඇති කරයි. මාධ්‍ය දැන්වීම් සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. මාධ්‍ය දැන්වීම් සාමාජික කටයුතු පහසු කරයි.
2. මාධ්‍ය දැන්වීම් ජනතාවගේ සිතිවිලි හා ආකල්ප වෙනස් කරයි.
3. මාධ්‍ය වෙළඳ දැන්වීම් යනු වෙළඳපොළ හා මාධ්‍ය අවශ්‍යතාවක් පමණි.
4. මාධ්‍ය දැන්වීම් සාමාජික අවශ්‍යතා පහසු කරයි.
5. මාධ්‍ය දැන්වීම් මහජන සේවා සපයන අතර මහජන සංවාද ගොඩනගයි.

(32) සමථකරණය වෙත යොමු වීම ආකාර තුනකින් සිදුවේ. ඒ පිළිබඳව ඇති **නිවැරදි** වරණය වන්නේ කුමක් ද?

1. සමථ මණ්ඩලය, අධිකරණය, ආගමික ස්ථාන මඟින්
2. පෞද්ගලික පාසල මඟින්, ග්‍රාම නිලධාරී මඟින්
3. ග්‍රාම නිලධාරී, පොලිසිය, අධිකරණය මඟින්
4. පෞද්ගලිකව, පොලිසිය මඟින්, අධිකරණය මඟින්
5. තෙවන පාර්ශවය, පොලීසිය, අධිකරණය මඟින්

(33) පහත ප්‍රකාශ අතර ඇති **සාවද්‍ය** කරුණ තෝරන්න.

1. විවේකය යනු නිකම් සිටීම නොව වැඩ කරන අතර ලබා ගන්නා විරාමයයි.
2. සරල විනෝදය මෙන්ම උසස් විනෝදය සැමදෙනාට ම අවශ්‍යය.
3. ගෘහස්ථ සාමය බිඳ වැටීමෙන් ගෘහයේ අපේක්ෂා බිඳ වැටේ.
4. ගෘහය තවත් ගෘහයක් හා සංසන්දනය කිරීම නොකළ යුත්තකි.
5. ගෘහය තුළ විශිෂ්ට සන්නිවේදන සංස්කෘතියක් ගොඩනැගීම කෙටි කාලීන ක්‍රියාවලියකි.

(34) සරල මානසික පීඩාවන්ට මුහුණ දීමේ දී **නොකළ** යුතු වන්නේ,

1. නිතිපතා ශාරීරික අභ්‍යාසවල නිරත වීම
2. වැඩ කටයුතු නිසි පරිදි සැළසුම් කිරීම
3. ළඟා කරගත හැකි ඉලක්ක තබා ගැනීම
4. පීඩනය ඇති කරන සිදුවීම් ඇති කර ගැනීම.
5. ප්‍රමාණවත් ලෙස නිදා ගැනීම.

(35) ගාන්ධිතුමාගේ සංවර්ධන භාවිතයේ දැකිය **නොහැකි** ලක්ෂණයක් වූයේ,

1. ස්වරාජ්ජ් සංකල්පය භාවිතයට ගැනීම.
2. චරකය මඟින් ස්වදේශීය නිෂ්පාදන සංකල්ප ගොඩනැගීම.
3. ප්‍රචණ්ඩත්වය මඟින් අධිරාජ්‍ය විරෝධය උත්සාහ කිරීම
4. ලුණු විරෝධය මඟින් අධිරාජ්‍යයට විරුද්ධ වීම.
5. රාම රාජ්‍ය සංකල්පයට ජනතාව හුරු කිරීම.

(36) **එවරට් එම් රොජර්ස්** සංවර්ධන සන්නිවේදනයට අදාළව ඉදිරිපත් කළ වඩාත් වැදගත් ම සංකල්පය වූයේ,

1. ජාතික අපේක්ෂාවන් උසස් මට්ටමට පත් කිරීම සඳහා ජනමාධ්‍ය යොදා ගැනීම
2. නවෝත්පදන විසරණය මඟින් ආකල්ප ඇති කිරීම
3. නවීන බහුජන මාධ්‍ය සංවර්ධනය සඳහා යොදා ගැනීම.
4. සම්ප්‍රදායික මාධ්‍ය හැකිතාත් යොදා ගැනීම.
5. ජාතිය පිළිබඳ හැඟීම් තහවුරු කිරීම.

(37) සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවල වැදගත් ලක්ෂණයක් නොවූයේ,

1. විශ්වාසනීයත්වය තහවුරු නොවීම.
2. ජන ජීවිතය සමඟ සම්බන්ධ වීම
3. ජන විශ්වාසයන් සමඟ බද්ධ වීම
4. සරල වීම
5. ප්‍රජාව සක්‍රීය ලෙස සම්බන්ධ වීම

(38) ප්‍රජා සහභාගිත්ව සංවර්ධන සන්නිවේදන ක්‍රමයක් **නොවීමට** වඩාත් සමීප වන්නේ,

1. සැළසුම් කිරීම
2. කාර්ය බෙදා ගැනීම
3. එක්ව වැඩ කිරීම
4. නියාමනය කිරීම
5. බලය මධ්‍යගත කිරීම

(39) සන්නිවේදන න්‍යාය හා ව්‍යවහාරය තුළ ප්‍රකට අංග දෙකක් වූයේ කුමක් ද?

1. ආකෘති හා මූලිකාංගය
2. ඥානය හා විහජනය
3. පණිවිඩ හා බලපෑමය
4. විඥාපනය හා බලපෑමය
5. සංජානය හා සන්නිවේදනය

(40) ජන සන්නිවේදනය මඟින් සිදු කළ යුතු වැදගත්ම සමාජ මෙහෙවරක් වන්නේ,

1. ආකර්ශනීය තොරතුරු මඟින් ජන මාධ්‍ය පුබුදුවාලීමය.
2. තොරතුරු මෙන්ම විනෝදය සඳහා ද වැඩි අවස්ථාවක් දීමය.
3. විෂය මූලික තොරතුරු මඟින් ග්‍රාහකයා තෘප්තිමත් කිරීමය.
4. ග්‍රාහකයා ජනප්‍රිය සංස්කෘතියේ සාමාජිකයෙක් කිරීමය.
5. විඥාපනය හා බලපෑම අවම කිරීමය.

(41) පහත සඳහන් ප්‍රකාශ අතර **අවම** වැදගත්කමක් ඇති වරණය තෝරන්න.

1. ජාතික ආර්ථික ස්වාධීනත්වයත් සමඟ ලිබරල් වාදය ගැටේ.
2. මාධ්‍ය මෙහෙය වන්නේ සාමාන්‍ය ග්‍රාහක බලපෑමෙනි.
3. මාධ්‍ය පවතින්නේ ව්‍යාපාරික අනුග්‍රහයෙනි.
4. නව ලිබරල් වාදයේ පදනම ගෝලීයකරණය යි.
5. මාධ්‍ය දූන්වීම්කරණයෙන් සමාජීය චර්යාවන් වෙනස් කෙරේ.

(42) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක නොවන ප්‍රජා මාධ්‍ය ගුවන් විදුලි ආයතනයක් වන්නේ,

1. ඌව ප්‍රජා ගුවන් විදුලිය
2. කොත්මලේ ප්‍රජා ගුවන් විදුලිය
3. මහ ඉලුක්පල්ලම ප්‍රජා ගුවන් විදුලිය
4. රුහුණු ගුවන් විදුලිය
5. කඳුරට ගුවන් විදුලිය

(43) සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වූ රාජ්‍යයක් **නොවූයේ,**

1. ශ්‍රී ලංකාව
2. බ්‍රසීලය
3. ඉන්දියාව
4. මියන්මාරය
5. ඩෙන්මාර්ක් රාජ්‍ය

(44) සාම්ප්‍රදායික මාධ්‍යයක දැකිය හැකි අවම ලක්ෂණයක් වන්නේ,

1. ජන විශ්වාස මත පදනම් වීමයි.
2. ජන ජීවිතයට වඩාත් සමීප වීමයි.
3. නිර්නාමික වීමයි.
4. තාක්ෂණය සමඟ බද්ධ වීමයි.
5. සරල ක්‍රියා කාරීත්වයයි.

(45) පුවත්පත් භාෂාව පිළිබඳ සාකච්ඡාවක දී ඒ තුළ දැකිය **නොහැකි** කරුණක් ලෙස ඉදිරිපත් වූ ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.

1. සරල සුගම භාෂාවක් භාවිත විය යුතුය.
2. සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීමේ දී පැහැදිලි විය යුතුය.
3. පාරිභාෂික වචන හැකිතාක් භාවිත කළ යුතුය.
4. ප්‍රාදේශීය භාෂා හැකිතාක් අඩු කළ යුතුය.
5. විදග්ධ භාෂාවක් නොවිය යුතුය.

(46) තොරතුරු සම්පාදනය සමාජය තුළ නවීකරණය ක්‍රියාවලියක් ඇති කරයි.

A - තොරතුරු අලෙවි කළ හැකි දෙයකි.
B - විවිධ මතවාදයන් ඉදිරිපත් කිරීමට හැකිවේ.
C - ජන විඥානය පුළුල් කිරීමට උපකාරී වේ.
D - විවිධ වැදගත් දේ සම්බන්ධයෙන් දැනුම අවබෝධය ලැබේ.
E - දෛනික ජීවිතයේ විධිමත් භාවය සඳහා උපකාරී වේ.

ඉහත ප්‍රකාශ අතර වැදගත් වන්නේ,

1. ABCD සත්‍ය අතර E වැරදිය.
2. ABCDE සියල්ල සත්‍යවේ.
3. AB සත්‍ය අතර CDE අසත්‍යය.
4. ABC අසත්‍ය අතර DE සත්‍යවේ.
5. BCD සත්‍ය අතර AE අසත්‍යවේ.

(47) ජනමාධ්‍ය මගින් සිදුවන ප්‍රචණ්ඩත්වය හා අයහපත් බලපෑම අවම කර ගැනීමට කළ **නොහැකි** වන්නේ කුමක් ද?

1. රාජ්‍ය මැදිහත් වී නිසි බලධරයන් පත් කිරීම
2. මාධ්‍ය සඳහා ආචාර ධර්ම පැනවීම
3. වාරණය සිදු කිරීම
4. ග්‍රාහක සමාජ බිහි කිරීම
5. මාධ්‍ය නිදහස පුළුල් කිරීම

(48) මහජන සම්බන්ධතාව සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශයක් වන්නේ,

1. ප්‍රසිද්ධිය හා ප්‍රචාරණය මූලික අරමුණක් වීම
2. ආයතනයේ කීර්තිනාමය හා ප්‍රතිරූපය ගොඩ නැගීම
3. ආයතනයක අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා පවත්වා ගැනීම
4. ආයතනයේ දියුණුව සඳහා මහජනයා සම්බන්ධ කර ගැනීම
5. ආයතනයේ බල සීමාව පුළුල් කරගත හැකි වීම.

(49) නව මාධ්‍යයක් ලෙස අන්තර්ජාලය භාවිත කිරීමේ දී වඩාත් වැදගත් වන ප්‍රකාශය වන්නේ,

1. අනෙක් මාධ්‍යයන්ට සාපේක්ෂව වේගවත් වීම.
2. ග්‍රාහක අවශ්‍යතාව මත පාලනය කළ නොහැකි වීම
3. හිමිකාරත්වය නිශ්චිත වීම
4. පරිහරණය සඳහා විශේෂිත දැනුමක් අවශ්‍ය නොවීම.
5. පිටපත් කර ගැනීමේ පහසුව අවම වීම

(50) මාධ්‍ය සංස්කෘතිය හේතු කොට ගෙන සමාජයේ ඇතිවිය හැකි වෙනස්කමක් නොවන්නේ,

1. නව පාරිභෝගික රටා සහ නව විලාසිතා සමාජගත වීම
2. ජනප්‍රිය සංස්කෘතියට අදාළ අංගවල මහාපරිමාණ නිෂ්පාදන බිහිවීම
3. පවතින ජනමාධ්‍ය ව්‍යුහයේ නව මාධ්‍ය ආකෘති රටා ගොඩ නැගීම.
4. ජනප්‍රිය සංස්කෘතිකාංග සමාජගත වීම
5. සම්ප්‍රදායික සංස්කෘතික රටා සංරක්ෂණය වීම

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

29 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය
Grade 13

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II
Communication & Media Studies - II

පැය තුනයි
Three hours

**සැලකිය යුතුයි :**

- **ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 20 කි.**

(01) සන්නිවේදනය අත්‍යවශ්‍ය මානවීය ක්‍රියාවලියකි. එහි වර්ධනයත් සමග ජනමාධ්‍ය ඇතුළු දියුණු සන්නිවේදන මාධ්‍ය ඔස්සේ අසීමාන්තිකව තොරතුරු ජනනය වේ.

i. **බර්ලෝ**ගේ සන්නිවේදන ආකෘතියේ අන්තර්ගත මූලිකාංග නම් කරන්න.

ii. සන්නිවේදනයේ **ස්වභාවයන්** හතරක් නම්කර ඉන් දෙකක් සඳහා උදාහරණ දෙන්න.

iii. **ෂැනොන් වීවර්**ගේ සන්නිවේදන ආකෘතිය **ගණිතමය** ආකෘතිය ලෙස හඳුන්වන්නේ ඇයි දැයි කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න.

iv. සන්නිවේදන **සංකල්ප** හතරක් නම් කර එය වාර්ථමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ දැකිය හැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(02) ජනමාධ්‍ය ක්‍රියාවලිය වර්තමාන සමාජය තුළ සංස්කෘතියට සෘජුව හා වක්‍රව බලපෑම් ඇති කරයි.

i. ජනමාධ්‍යවල දොරටුපාල ක්‍රියාවලිය හේතුවෙන් සංදේශවලට සිදුවන බලපෑම් හතරක් නම් කරන්න.

ii. ජනමාධ්‍ය ග්‍රහක ස්වභාව දෙකක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. වර්තමාන ජනමාධ්‍ය සිය ග්‍රාහකයින් පොළඹවා ගැනීමට යොදාගන්නා උපක්‍රම තුනක් උදාහරණ සහිතව පහදන්න.

iv. **''සමාජානුයෝජන ක්‍රියාවලියේ දී ප්‍රභල භූමිකාවක් රූපවාහිනිය ඉටුකරයි.''** මේ පිළිබඳව බිත්ති පුවත් පතකට ලිපියක් ලියන්න.

(03) සන්නිවේදන කුසලතා හා නිපුණතා පුද්ගල ජීවිතය සංවර්ධනය කරයි.

i. **ඵලදායී කථිකයෙකු** සතු ගුණාංග හතරක් ලියන්න.

ii. ශ්‍රවණ හැකියාව **දුර්වලවීමට** බලපාන සාධක හතරක් නම්කර ඉන් දෙකක් කෙටියෙන් පහදන්න.

iii. සමූහ සන්නිවේදනය සඳහා ආචාරශීලිත්වය වැදගත්වේ. කරුණු තුනක් ඇසුරින් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

iv. උපකරණාධාර සන්නිවේදන කුසලතා පැවතීම සමූහ සන්නිවේදනයේ දී වැදගත්වන ආකාරය පිළිබඳව කරුණු හතරක් පදනම්කර ලිපියක් සම්පාදනය කරන්න.

(04) මහජන සම්බන්ධතාව ආයතනයකට මෙන්ම පුද්ගලයෙකුට ද වැදගත් වේ. ඒ අනුව කිසියම් ගැටලුවක් මතු උවහොත් වැරදි අවබෝධය තුරන් කළ යුතුය.

i. වාණිජ්‍යමය ආයතනයක දක්නට ලැබෙන මහජන කණ්ඩායම් හතරක් නම් කරන්න.

ii. පොලිස් ස්ථානයක මහජන සම්බන්ධතාව ක්‍රියාත්මක වන ආකාර හතරක් කෙටියෙන් දක්වන්න.

iii. මාධ්‍ය සාකච්ඡාවක් සංවිධානය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු හරතක් ලියන්න.

iv. පාරිසරික මෙවලම් යොදා ගැනීමෙන් ආයතනයක අභ්‍යන්තර හා බාහිර මහජන සම්බන්ධතාව වර්ධනය වන ආකාරය පිළිබඳ කරුණු හතරක් පදනම් කරගෙන රචනයක් ලියන්න.

(05) ස්වභාවික ආපදාවල දී ජනමාධ්‍ය මඟින් සිදු කළ හැකි සේවාව අති විශාලය.

i. ස්වභාවික ආපදා කළමනාකරණයට ජනමාධ්‍යයට කළ හැකි කාර්යන් දෙකක් සඳහා උදාහරණ දෙන්න.

ii. ස්වභාවික නොවන ආපදා පිළිබඳ නිතර වාර්තා වේ. ඉන් හතරක් නම් කර කරුණු දෙකක් පැහැදිලි කරන්න.

iii. **පුරවැසි මාධ්‍යකරුවා**ගේ ලක්ෂණ හතරක් නම් කර ඉන් තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න.

iv. **විකල්ප** හා **විරෝධා** කල්ප මාධ්‍යයකරුවාගේ ලක්ෂණ හතරක් පදනම් කරගෙන විකල්ප මාධ්‍ය වර්තමාන සමාජයට අවශ්‍ය වන්නේ ඇයි දැයි කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.

(06) මාධය හා සංස්කෘතිය අතර ඇත්තේ අවියෝජනීය සබඳතාවයකි.

i. සංස්කෘතියේ මූලික අංග හතරක් නම් කරන්න.

ii. මාධ්‍ය සංස්කෘතියේ අවශ්‍යතාවය පිළිබඳ කරුණු දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iii. සංස්කෘතික **විසරණය** ඕනෑම සමාජයක දැකිය හැකිය. සමාජයන් සංවර්ධනය වීම සඳහා එය බලපාන ආකාරය කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න.

iv. ජනමාධ්‍ය වෙළඳ දැන්වීම් ගෘහයට හා සමාජයට සිදු කරන බලපෑම කරුණු හතරක් පදනම් කරගෙන විස්තර කරන්න.

(07) සංවර්ධනය හා ජනමාධ්‍ය අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී.

i. සංවර්ධන නිලධාරියෙකුගේ අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍ර හතරක් නම් කරන්න.

ii. සංවර්ධන සන්නිවේදනයට අදාළ මතවාද ඉදිරිපත් කළ විද්වතුන් හතරදෙනෙකු නම් කර ඉන් දෙදෙනෙකුගේ අදහස් පැහැදිලි කරන්න.

iii. සංවර්ධන ක්‍රියාවලිය සඳහා **සහජීවනය** වැදගත් වේ. සරල මානසික පීඩාවලින් මිදීමට උපයෝගී කරගත හැකි ක්‍රියා මාර්ග තුනක් පැහැදිලි කරන්න.

iv. ගෘහස්ථ සාමය හා සහජීවනය බිඳ වැටීම නිසා ගෘහය තුළ ඇතිවිය හැකි අහිතකර ලක්ෂණ හතරක් සඳහන් කර එහි ප්‍රතිවිපාක හතරක් පැහැදිලි කරන්න.

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**දෙවන වාර පරීක්ෂණය - 2019**

**13 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** **විසඳුම් පත්‍රය**

## I - පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. - 3 | 02. - 4 | 03. - 3 | 04. - 2 | 05. - 1 | 06. - 1 | 07. - 2 | 08. - 3 | 09. - 4 | 10. - 5 |
| 11. - 4 | 12. - 3 | 13. - 2 | 14. - 1 | 15. - 5 | 16. - 1 | 17. - 2 | 18. - 3 | 19. - 4 | 20. - 5 |
| 21. - 4 | 22. - 3 | 23. - 2 | 24. - 1 | 25. - 5 | 26. - 4 | 27. - 3 | 28. - 2 | 29. - 1 | 30. - 2 |
| 31. - 3 | 32. - 4 | 33. - 5 | 34. - 4 | 35. - 3 | 36. - 2 | 37. - 1 | 38. - 5 | 39. - 4 | 40. - 3 |
| 41. - 2 | 42. - 1 | 43. - 5 | 44. - 4 | 45. - 3 | 46. - 2 | 47. - 5 | 48. - 1 | 49. - 1 | 50. - 5 |

## II - පත්‍රය

(01) i. මූලාශ්‍රය, සංදේශය, නාලිකාව, ග්‍රාහකයා (ලකුණු 1/2 × 4 =2)

(මෙම අංග පමණක් ඇත්නම් ලකුණු දෙන්න.)

ii. * සන්නිවේදනය ඒක මාර්ගික හෝ ද්වි මාර්ගික වේ.
* සන්නිවේදනයේ රටා පවතී.
* සන්නිවේදනය අවස්ථානුකූලය.
* සන්නිවේදනය පුද්ගල බද්ධ වේ.
* සන්නිවේදනයේ දොරටුපාල සංකල්පයක් පවතී.
* සන්නිවේදනය තුළ වාරණය නම් සංකල්පයක් පවතී,
* සන්නිවේදනය අරමුණු සහගතය.

(නම් කිරීමට ලකුණු 1/2 × 4 = 2

(උදාහරණ 2 සඳහා 1 × 2 = 2)

iii. * ජන මාධ්‍ය ක්‍රියාවලියට අදාළව ගොඩ නගා ඇත.
* ප්‍රතිපෝෂණය පිළිබඳ අවබෝධයක් නැත.
* සන්නිවේදන බාධා පිළිබඳ අවධානය යොමු කරයි.
* සම්ප්‍රේෂකාගාරයේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කරයි.

(ලකුණු 2 × 3 =6)

iv. * අධිපතිවාදී සන්නිවේදන සංකල්පය
* සෝවියට් සන්නිවේදන කොමියුනිස්ට් සංකල්පය
* නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය
* සමාජ වගකීම් සන්නිවේදන සංකල්පය
* සංවර්ධන සන්නිවේදන සංකල්පය
* ප්‍රජාතන්ත්‍රවාදී සන්නිවේදන සංකල්පය
* වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණයේදී බලපත්‍ර ලබා ගැනීම බඳු පැනවීම මත ක්‍රියාත්මක වීම.
* මාධ්‍ය නිදහස විවිධ ආකාරයෙන් පැවතීම.
* සමාජ වගකීම සඳහා රජය මැදිහත් වීම හා නියාමනය.
* සංවර්ධනයට අදාළව රජයේ පුවත් ඉදිරිපත් කිරීම.
* තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවතිය යුතු බව පැහැදිලි වීම.

(ලකුණු 2 × 4 = 8)

02. i. * කොටස් සීමා කිරීම
* පුළුල් කිරීම
* ප්‍රතිසංවිධානය කිරීම
* වාරණය කිරීම
* සංස්කරණය කිරීම
* විකෘති කිරීම (ලකුණු 1/2 × 4 =2)

ii. * ග්‍රාහක ස්වභාවය විෂම ජාතීයවේ.

* ග්‍රාහකයා ජනමාධ්‍ය සමගනොව සංදේශ සමඟ බැඳී සිටී.
* සක්‍රීය ග්‍රාහකයින් මෙන්ම නිශ්ක්‍රීය ග්‍රහකයින් ද දැකිය හැක.
* ග්‍රහකත්වයට නායකත්වයක් නොමැත.
* ග්‍රාහකයින් එකිනෙකා නොහඳුනයි. (නම් කිරීම ලකුණු 1/2 × 4=2) (පැහැදිලි කිරීම 1 × 2 = 2)

iii. * මුදල් බෙදා දීම

* ජනප්‍රිය චරිත යොදා ගැනීම
* සංගීත සංදර්ශන
* රියලිටි වැඩ සටහන්
* නව වැඩසටහන් ආකෘති
* ත්‍යාග ලබාදීම
* විදේශ සංචාර ලබා දීම (ලකුණු 2 × 3 = 6)

iv. * නව සංස්කෘතීන් හර පද්ධති හඳුන්වා දීම

* විවිධ වැඩසටහන් මඟින් භාෂාව හඳුනාව දීම
* නවීකරණ ක්‍රියාවලියට යොමු කිරීම
* නව විලාසිතා හඳුනාව දීම
* ගෝලීය සමාජයේ සාමාජිකයෙකු බවට පත් කිරීම (ලකුණු 2 × 4 = 8)

03. i. * අරමුණු සහගතව කතා කිරීම

* ග්‍රාහකයා පිළිබඳ අවබෝධයෙන් කතා කිරීම
* සංවිධානාත්මක බව
* තර්කානු කූල බව
* පෙර සූදානම
* නිවරදිව, නිරවුල්ව, පැහැදිලිව කතා කිරීම

(ලකුණු 1/2 × 4=2)

ii. * අවශ්‍යතාවක් නොමැති වීම

* නිසි අවධානයක් නොමැති වීම
* භාෂාව අවබෝධ කරගැනීමට නොහැකි වීම
* දුර්වල සංජානනය
* භාෂාව ග්‍රහණය කරගැනීමට නොහැකි වීම

(ලකුණු නම් කිරීම 1/2 × 4 =2) (පැහැදිලි කිරීම 1 × 2=2)

iii. * නායකත්වයට ගරු කිරීම හා අවනත වීම

* ප්‍රශස්ත ප්‍රතිචාර දක්වීම
* කණ්ඩායම් හැඟීම
* වගකීම සහ වගවීමෙන් කටයුතු කිරීම
* සහජීවනය (ලකුණු 2 × 3 = 6)

iv. * කථන සන්නිවේදන උපකරණ භාවිතය

* ප්‍රක්ශේපණීය සන්නිවේදන උපකරණ භාවිතය
* ප්‍රක්ෂේපණීය නොවන සන්නිවේදන උපකරණ භාවිතය
* පාරිසරික මෙවලම් භාවිතය (ලකුණු 2 × 4 =2)

04. i. * ප්‍රජාව

* සේවක පරිස
* සේවා හා ද්‍රව්‍ය සපයන්නෝ
* ආයෝජකයින්
* බෙදා හරින්නන්
* පාරිභෝගිකයින් හා පරිශීලකයින්
* උපදේශකයින් (ලකුණු 1/2 4 =2)

ii. * අපරාධ නිවාරණය පිළිබඳව පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීම

* විවිධ වැඩමුළු දේශන සංවිධානය
* ප්‍රදර්ශන කුටි සංවිධානය

* ආපදා අවස්ථාවල දී මහජනයාට පිළිසරණ වීම
* ජාතික වැදගත්කමක් ඇති අවස්ථාවල දී ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා එකාබද්ධව ක්‍රියාත්මක වීම

(ලකුණු 1 × 4 =4)

iii.
* අරමුණු නිශ්චය කිරීම
* මාධ්‍ය සාකච්ඡාවට සම්බන්ධ වන පුද්ගලයන් තීරණය කිරීම
* පවත්වන දිනය, ස්ථානය, වේලාව තීරණය කිරීම
* න්‍යාය පත්‍රයක් සකස් කිරීම
* සහභාගී වන්නන්ට ආරාධනා කිරීම
* ඉදිරිපත් කිරීමට අවශ්‍ය කරුණු ගොනුකර ගැනීම
* ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට තොරතුරු සකස් කර ගැනීම
* පැමිණීම තහවුරු කර ගැනීම
* පිළිගැනීම, සංග්‍රහ කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය
* ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබාදීම. (ලකුණු 1 × 6 =6)

iv. **අභ්‍යන්තර**
* ප්‍රියජනක, සේවා ස්ථානය
* සේකයින්ගේ කාර්යක්ෂමතාව
* පෙළඹවීම
* සුබවාදී ආකල්ප ඇතිවීම (ලකුණු 2 × 2 =4)

**බාහිර**
* කාර්යන් පහසු වීම
* කීර්ති නාමය අත්පත් වීම
* අන්‍යෝන්‍ය සබඳතා ගොඩනැගීම
* ගැටලු විසඳා ගැනීමට හැකි වීම (ලකුණු 2 × 2 =4)

05. i.
* පූර්ව දැනුම් දීම
* ස්වභාවික ආපදාවන්ට මුහුණ දෙන ආකාරය පිළිබඳ වැඩ සටහන් ඉදිරිපත් කිරීම.
* පූර්ව සූදානම පිළිබඳ දැනුම්වත් වීම
* මුදවා ගැනීම, සහන සැපයීම පිළිබඳ අවබෝධයක් ලබා දීම. (ලකුණු 1 × 2=2)

ii.
* ගිනි උවදුරු
* විදුලි සැර වැදීම
* අනාරක්ෂිත ළිං වලට වැටීම
* දියේ ගිලීම
* රිය අනතුරු
* දුම්රිය අනතුරු (ලකුණු නම් කිරීම 1/2 × 4 =2) (පැහැදිලි කිරීම 1 × 2=2)

iii.
* වෘත්තීය මාධ්‍යකරුවෙකු නොවේ.
* මාධ්‍ය ත්‍රිත්වයම භාවිතා කරයි.
* දියුණු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම අවම වේ.
* මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ විධිමත් අවබෝධයක් නැත.
* පුරවැසි හඬ සොයා ගොස් ඒවා හෙළිදරව් කරයි.
* ගවේෂණාත්මක වාර්තා කරණයේ ලක්ෂණ ඇත.
* සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය උත්කර්ෂණයට ලක් කරයි.
* ඇතැම් විට නව මාධ්‍ය තාක්ෂණය යොදා ගැනීම
* පුරවැසි දෘෂ්ටි කෝණය මතු වීම (ලකුණු 2 × 3 = 6)

iv.
* ප්‍රධාන ධාරාවේ මාධ්‍යයට එරෙහිව ගොඩ නැගේ.
* නව සමාජ මතයක් සමාජගත කිරීම අරමුණ වේ.
* ගෝලීයකරණයට හා වර්ගවාදයට විරුද්ධවේ.
* නව අධි පරිභෝජන සංස්කෘතියට විරුද්ද වේ.
* ගවේෂණාත්මක වාර්තා කරණය මඟින් වංචා දූෂණ හෙළි දරව්ව කරයි.
* නව සමාජ හර පද්ධතීන් සමාජගත කරයි.
* වර්තමාන ප්‍රධාන ධාරාවේ මාධ්‍ය අධිපතිවාදී වේ. (ලකුණු 2 × 4 = 8)
* ප්‍රධාන මාධ්‍ය ජනප්‍රිය සංස්කෘතිය මත පදනම් වන හෙයින් ග්‍රාහකයා තුළ නව චින්තන ගොඩ නොනැගේ.

06. i. * උප සංස්කෘතිය
* විරෝධී සංස්කෘතිය
* සංස්කෘතික විසරණය
* සංස්කෘතික සම්පර්කය
* සංස්කෘතික රාශිකෘතය
* සංස්කෘතික ලැග්ම
* සංස්කෘතික ත්වරණය (ලකුණු 1/2 × 4 =2)

ii. * නවීකරණයට අවශ්‍ය පෙළඹවීම් ඇති කිරීම
* නව තොරතුරු සමාජයක සාමාජිකයකු කිරීම
* ජීවිතය පහසු කරවීම
* අන්තර් සංස්කෘතික සබඳතා ගොඩ නැංවීම
* බහු සංස්කෘතික සමාජයක සාමාජිකයකු බවට පත් කිරීම (ලකුණු 2 × 2 =4)

iii. * කිසියම් සංස්කෘතියක් දියුණු වීමට තවත් එවැනිම සංස්කෘතියක් දියුණු වීම බලපෑම
* දියුණු සංස්කෘතියක අග නගරය තුළ වේගයෙන් ව්‍යාප්ත වීම
* විසරණය වූ අංග තම සංස්කෘතියේම අංග ලෙස සැලකීම
* විසරණය ඓතිහාසික සෑම සංස්කෘතියම සිදුවීම (ලකුණු 3 × 2 =6)

iv. * පරිභෝජන රටා වෙනස් කිරීම
* ජීවන රටා වෙනස් කිරීම
* චින්තන රටා වෙනස් කිරීම
* සම්ප්‍රදායික සංස්කෘතික අනන්‍යතා ගිලිහී යාම
* ප්‍රචණ්ඩත්වය ආරෝපණය කිරීම
* ලිංගිකත්වය උත්කර්ෂයට ලක් කිරීම
* අසම්මත චර්යාවන්ට හුරු කිරීම
* සමාජය බිය ගැන්වීම (ලකුණු 2 × 4 =8)

07. i. * ආර්ථික ක්ෂේත්‍රය * සමාජ ක්ෂේත්‍රය
* සෞඛ්‍ය ක්ෂේත්‍රය * සංස්කෘතික ක්ෂේත්‍රය
* අධ්‍යාපන ක්ෂේත්‍රය * පරිසරාත්මක ක්ෂේත්‍රය
* දේශපාලන ක්ෂේත්‍රය * සදාචාරාත්මක ක්ෂේත්‍රය
* නෛතික ක්ෂේත්‍රය * ආගමික ක්ෂේත්‍රය (ලකුණු 1/2 × 4 =2)

ii. * විල්බර් ශ්‍රාම්
* ඩැනියල් ලර්නර්
* එවරට් එම් රොජර්ස්
* ඩඩ්ලි සියර්ස්
* පෝල් පී ස්ටීවන්ස් (නම් කිරීම 1/2 × 4 =2) (පැහැදිලි කිරීම 1 × 2 =2)

iii. * ප්‍රමාණවත් ලෙස විවේක ගැනීම
* කලා නිර්මාණ රස විඳීම
* කාර්ය කළමනාකරණය
* කාල කළමනාකරණය
* ආගමික වතාවත්වල යෙදීම
* ශාරීරික අභ්‍යාසවල නිරත වීම (ලකුණු 2 × 3 =6)

iv. * එකිනෙකා නොරිස්සීම
* සන්නිවේදනය බිඳ වැටීම
* එකිනෙකා සැක කිරීම
* නිවසේ රැඳී සිටින කාලය අඩු වීම
* අන්‍යෝන්‍ය ගෞරවය නොතිබීම
* ඇගයීමක් නොකිරීම

<u>ප්‍රතිවිපාක</u>

* පවුලේ සම්බන්දතා බිඳ වැටීම
* දරුවන්ගේ අධ්‍යාපනය ඇන හිටීම
* කුටුම්බ අපේක්ෂා අඩාල වීම
* සමාජ අප්‍රසාදයට බඳුන් වීම
* එකිනෙකාට හානිදායක ලෙස කටයුතු කිරීම (ලකුණු 2 × 4 =8)